

දයානන්ද
රත්නායක



# ජෝතිමත් ගීතයේ සරත් සමය..

එච්.ආර්.ජෝතිපාල ගැයූ ගීත වලින් වර්තමාන සංගීත රසිකයන්ගේ අවධානයට පාත්‍ර විය යුතු යැයි හැඟෙන ගීත තෝරාගනිමින් කෙරෙන මේ කතාබහේදී ඔහුගේ සංගීත දිවියේ වැදගත්ම හැරවුම් ලක්ෂයක් වෙත අද ඔබ කැඳවමි.

ශිල්පියකු ගැයූ ජනප්‍රියම ගීතාවලියකින් ගීත තෝරා ගනිද්දී ඒ ශිල්පියාගේ සංගීත දිවියේ කඩඉම් සලකුණු කළ ගීත ඔහුට පමණක් නොව ඔහු වටා රැඳීසිටි රසිකයන්ටද වැදගත් වන්නේ රසිකයන්ගේ රසවින්දනාත්මක ඉසව්ද ඒ ගීත මගින් ස්පර්ශ කර ඇති බැවිනි. අද මේ සටහනේදි අහන්නට ලැබෙන ගීත ඔහුගේ නිර්මාණ දිවියේ කුමන ආකාරයකින් වැදගත් කමක් උසුලන්නේ ද යන්න ඔබටම නිගමන කල හැකි ය.

ජෝතිපාලගේ සංගීත දිවියේ ඔහුට හමුවූ මධුර ගී හැදූ සරත්ලා සිවු දෙනෙකි. ඒ සරත් දසනායක,


සරත් දසනායක

සරත් බාලසූරිය, සරත් ද අල්විස් සහ සරත් වික්‍රම යන සංගීත වේදීන් සිවු දෙනා ය. ඔවුන් හතර දෙනාගෙන් සරත් බාලසූරිය ජෝතිපාලට සැළකිය යුතු ගීත ප්‍රමාණයක් නිර්මාණය කර නැති වුවත් ඉතිරි තිදෙනා ජෝතිපාලට මධුරතර සංගීත නිර්මාණ කළ සංගීත වේදීන් බව කිව යුතුම ය. ඒ නිසා ඉඩක් ලැබෙන පරිදි ජෝතිට ගී හැදූ මේ සරත්ලා හතරදෙනාගේම එකිනෙකට වෙනස් වූත් මධුරතර වූත් ගී තනු නිර්මාණ ගැන කිසියම් ප්‍රමාණයකට සඳහන් කිරීමට අපේක්ෂා කරමි.

ඒ අනුව අද මුල්වරට කතාබහට ලක් කරන්නේ සිංහල සිනමා සංගීතයට පුරෝගාමී මෙහෙවරක් කළ අග්‍රගණ්‍ය සංගීත වේදී සරත් දසනායකයන් එච්.ආර්.ජෝතිපාලට හැදූ රම්‍ය වූත් මධුරතර වූත් ගීත පිළිබඳව ය. ඒ නිසා අපි ඒ ගීත අහන ගමන්ම මේ කතාබහ කරමු.

**නීල දෑස පුරා - සිහින ලොවෙන් පෙරා**
**වෑහෙ කැලුම් නුරා - මා ඔබේ පෙම්බරා**
**සසරෙ එකට සරා - පැමිණ පෙරුම්පුරා**
**ගියද නොසිතු යුරා - මා ඔබෙ පෙම්බරා**

**මිහිරි සුවඳ ඔබේ - ම හදවතට එබේ**
**පෙරදි දිනක බවේ -ලදිමි මෙවන් සුවේ**
**සසරෙ එකට සරා - පැමිණ පෙරුම්පුරා**
**ගියද නොසිතු යුරා - මා ඔබෙ පෙම්බරා**

**මාද ඔබද මෙසේ - දෙපොල දෙතැන වෙසේ**
**දිනෙක මෙලොව කුසේ - පතමි රැ කෂන ලෙසේ**
**සසරෙ එකට සරා - පැමිණ පෙරුම්පුරා**
**ගියද නොසිතු යුරා - මා ඔබෙ පෙම්බරා**

**පද රචනය - කරුණාරත්න අබේසේකර**
**සංගීතය - සරත් දසනායක**
**ගැයුම - එච්. ආර්.ජෝතිපාල**

කේමදාසයන් හැරුණු විට ජෝතිපාලට හොඳම සහ මධුර ස්වතන්ත්‍ර ගීත හැදුවේ සරත් දසනායක ය. ජෝතිපාලගේ ගීතවල සාර්ථකම සහ හොඳම ගී තනු අපට හමුවන්නේද සරත් දසනායක - ජෝතිපාල සම්බන්ධතාව ඇති වූ පසුව ය. එසේ ජෝති - සරත් සම්බන්ධතාවය ගොඩ නැගෙන්නේ ඉතාමත් අපූර්ව සිද්ධි සමුදායක ප්‍රතිඵලයක් ලෙසිනි.

ඒ කතාව කියන්නට කලින් එක සඳහනක් කළ යුතුම ය. එනම් මට කිසිම දිනෙක පුද්ගලිකව සරත් දසනායක හමුවී නැත. එසේ වුවත් ඔහු කෙරෙහි මගේ හිතේ ඇති ගෞරවය එසේ ම පවතිද්දී මෙතැන් පටන් මම ඔහුට "දසේ" යයි කියමි. ඒ මන්ද ඔහුට දසේ කියා එවකට සංගීත ක්ෂේත්‍රයේ සිටි බොහෝ සමකාලිනයන් ඇමතුවේ ඒ නමිනි. මා ඔහුගේ සමකාලීනයෙකු හෝ මිත්‍රත්වයක් තිබුණ අයෙකු නොවුණත් ක්ෂේත්‍රයේ බොහෝ දෙනෙක් ඔහු ඇමතූ දසේ යන ආදර"ය නාමය මම ද මෙතැන් සිට භාවිතා කරමි.

ජෝතිපාලට හැදූ ස්වතන්ත්‍ර ගීතවලින් සියයට අසූවකටත් වඩා හැදුවේ සරත් දහනායක හෙවත් දසේ ය. හැත්තෑව අසූව දශකවල හින්දි සිනමාවේ සංගීත අඹර බැබල වූ ශංකර් ජායි කිෂන්, ආර්.ඩී. බර්මන් හින්දි චිත්‍රපට ගීතය හින්දි සිනමාවේ වර්ණවත් කළේ යම් සේ ද එසේ ම දසේ සිංහල සිනමා සංගීතය හින්දි අනුකාරකත්වයෙන් මුදවා ජනප්‍රිය හින්දි ගීවලට අභියෝග කළ හැකි ස්වතන්ත්‍ර මධුර ගී හැදූවේ ය. මා මෙහි කතා කරන්නේ ජෝතිපාලගේ නිර්මාණ ගැන පමණක් වුවත් එයින් බාහිරව දශක තුනක් තිස්සේ සිංහල චිත්‍රපට 131 ක් සඳහා දසේ හැදූ මධුර ගීතාවලිය දසේගේ ලාංකේය සිනමා සංගීතයේ සළකුණ කුමක්ද යන්න විමසා බලන්නට මෙතෙක් නිසි විචාරයක් සිදුවී නොමැත. එසේ වූයේ හැත්තෑව දශකයේ සිනමා සංගීතය පවා කලාත්මක සහ වාණිජ වශයෙන් වෙන්කර තිබූ නිසාත් වාණිජ සිනමාව කලාත්මක සිනමාවෙන් බැහැර වූ නිසාත්ය.

සරත් දසනායක අඩසිය වසකට වැඩි ලාංකේය සිනමා සංගීතයේ යුග පුරුෂයෙකි. ලාංකේය සංගීත ක්ෂේත්‍රයේ එසේ යුග පුරුෂයන් යැයි කිව හැකි අය අපට සිටින්නේ දෑතේ ඇඟිලි ගණනටත් වඩා අඩු නිර්මාණකරුවන් පිරිසකි. ඒ තරමට ම අල්ප ය. එසේ ඔවුන් සිනමා සංගීතයේ යුග පුරුෂයන් යයි හැඳින්වීමට අවශ්‍ය නිර්ණායක අපට සපුරා ඇත්තේ පස් දෙනෙකි. ඒ

1. ආචාර්ය ඩබ්ලිව්. ඩී. අමරදේව
2. ආචාර්ය ප්‍රේමසිරි කේමදාස
3. සරත් දසනායක
4. ආචාර්ය වික්ටර් රත්නායක
5. රෝහණ වීරසිංහ

ඔවුහු දීර්ඝ කාලයක් පුරා සංගීතයේ නියැලෙමින් දේශිය සිනමාවටත් සමස්ත ලාංකේය සංගීතයටත් සැබෑ මෙහෙවරක් කළා වූ දැවැන්තයෝ ය. අමරදේවයන් සහ කේමදාස හැටේ දශකයේදීත්, සරත් දසනායක සහ වික්ටර් රත්නායක හැත්තෑව දශකයේදීත් රෝහණ වීරසිංහ අසූව දශකයේදිත් සිනමා සංගීතයට පුරෝගාමී මෙහෙවරක් කළාහු නිර්මාණකරුවෝ වෙති.

**ඔබ නිදන්න ඔබ නිදන්න සුවෙන් සැතපිලා**
**ඉහ ඉද්දර මම ඉන්නම් පවන් සල සලා**

**පෙම්බරයන් පෙම්බරියන් වෙත කියූ කතා**
**පවසන්නම් සොඳුරියෙ මම ඔබට ගොත ගොතා**
**රුසිරු කොමල රුව රසඳුන් උලයි මගෙ නෙතේ**
**ඉසුරුමුණියෙ පෙම් යුවලද කියා මට සිතේ**

**හිත මාගේ හඳුනා ගත් පරමාදරියේ**
**ඔබ වාගේ සුන්දරියක් ඇත සීගිරියේ**
**අපේ ලොවට නවෝදයේ එළිය පාදනා**
**අලුත් ඉරක් පායනු ඇත හෙට උදෑසනේ**

**පද රචනය - කරුණාරත්න අබේසේකර**
**සංගීතය - සරත් දසනායක**
**ගැයුම - එච්. ආර්.ජෝතිපාල**

සරත් දසනායක සංගීතය ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන සංගිත අධ්‍යක්ෂකවරෙයකු බවට පත්වන්නේ හැත්තෑව දශකය ආරම්භයේදී ම ය. 1968/69 කාලය වන විට දසේ චිත්‍රපට දෙකක සංගීත නිර්මාණ කටයුතු අරඹා තිබුණත් ඉන් වසර හතරක් පහක් හෝ දහයක් පමණ කල් ගතවී ඒවා තිරගත වී ඇත්තේ හැත්තෑව දශකයේදි ය. ජෝතිපාල ගැයූ ගීත ගැන ලියවෙන මොහොතක මේ තරම් දිග විස්තරයක් දසේ වෙනුවෙන් මේ සටහන තබන්නට සිදු වූයේ ජෝති - සරත් දසනායක සුසංයෝගය කෙබඳු ආකාරයෙන් ගොඩනැගුනේද යන්න ලාංකේය සංගීත රසිකයන්ට ගෙනහැර දැක්වීම සඳහා ය.

## සේන - මිල්ටන් - සෝමේ- ජෝති - දසේ - අලූත් මගක....

ඒ හැත්තෑව දශකයේ ආරම්භය යි. ඒ දශකයේ සිංහල සිනමාවට නවක නළු නිළියන්මෙන්ම චිත්‍රපට අධ්‍යක්ෂකවරු, නිෂ්පාදකවරු සිංහල සිනමාව පිවිසි යුගය යි. හින්දි සහ දෙමල කොපි චිත්‍රපට කලාවෙන් මිදුන කලාත්මක වාණිජ චිත්‍රපට නිෂ්පාදකයෙක් සිංහල සිනමාවට එබිකම් කරමින් සිටියේ ය. ඔහු වෙනින් කවුරුත් නොව සේන සමරසිංහ ය. සමරසිංහ චිත්‍රපට කියූ පමණනින් හැත්තෑව දශකයේ සිනමා ලෝලීන්ට අමතක නොවන තරම් රසාලිප්ත චිත්‍රපට හැදූ නාමයකි. සේනට ඕනෑ වූයේ කලාත්මක වාණිජ චිත්‍රපටයක් කරන්නට ය. සේන ඒ සදහා රංගනයට තෝරාගෙන තිබුණේ ගාමි" - මාලනී - ජෝ- යන ප්‍රතිභාසම්පන්න රංගන ත්‍රිත්වය යි. කැමරාව මෙහෙයවීම මර්සලින් පෙරේරාට භාර විය. එකල සිනමා කැමරාකරණයේ නමක් දිනාගෙන සිටි මර්සලීන් ලෙස්ටර් ජේම්ස් පීරිස්ට සිටි හොඳම කැමරාකරුවෙකි. චිත්‍රපටයේ සංස්කරණ ශිල්පියාද අලූත් ය. සේනගේ චිත්‍රපටයේ තිර රචනය සහ දෙබස් ලිවීම පැවරී තිබුණේ සෝමපාල ලීලානන්දට ය. චිත්‍රපටයේ අධ්‍යක්ෂණය සඳහා මිල්ටන් ජයවර්ධනට පවරා තිබුණි. චිත්‍රපටයේ ගීත ගායනය සඳහා තෝරාගෙන සිටි ගායක ගායිකාවන් වූයේ ජෝතිපාල - ඇන්ජලීන් - වික්ටර් - ඉන්ද්‍රාණී - එම්.එස්.ප්‍රනාන්දු ය. සේන - ගාමිණී - මිල්ටන්- සෝමේ චිත්‍රපටය ගැන කතාබහ කරන්නට නිතර නිතර හමු වූයේ රඹුක්කන පිහිටි සේනගේ නිවස ය. ඒත් සංගීතයට කෙනෙක් නැත. චිත්‍රපටයට රූ ගත කිරිමට සියල්ල සූදානම් ය. ඊට කලින් චිත්‍රපටයේ ගීත හැදිය යුතු ය. චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂකවරයෙක් නැතුව අවුලකි.

"මචං ෆිල්ම් එකේ මියුසික් වලට පී.එල්.ඒ. සෝමපාල දාන්ඩ කියලා සේන කියනවනෙ" මිල්ටන් ජයවර්ධන සෝමපාල ලීලාන්දට කීවේය.

"යමං අපි සේනව හම්බවෙලාම සේන එක්ක කතාකරමු" සෝමේ මිල්ටන්ට කීවේය. එදා රෑම ඔවුහු රඹුක්කනට ගියහ. ඒවන විටත් සේන සමරසිංහ පදිංචි වී සිටියේ රඹුක්කන ය. සෝමේටත් මිල්ටන්ටත් අවශ්‍ය වූයේ චිත්‍රපටයේ මියුසික් කරන්න සරත් දසනායක දාගන්නට ය. සේන ඒ වැඩේට එතරම් මනාපයක් දැක්වූයේ නැත. ඒ නිසා කෙසේ හෝ දසේ මේ චිත්‍රපටයට දමා ගැනිමට සේන සමරසිංහ කැමති කරවා ගැනිම මිල්ටන්ගේත් සෝමේගේත් එකම අරමුණ විය.

දසේ ඒ කාලේ පාසැල් ගුරුවරයෙකි. ඒ වන විටත් සිතිජය සහ විශ්මය චිත්‍රපටවල සංගිතය සරත් දසනායක විසින් අධ්‍යක්ෂණය කර තිබුණත් ඒවා පෙන්නලා නැත. ඊටත් වඩා ඒවායේ ගීත ගායනා කර තිබුණේ අමරදේව - ටී.එම්. - නීලා - වික්ටර් - නන්දා - සනත් වැනි ශාස්ත්‍රීය මට්ටමේ ගායක ගායිකාවන් ය. එවන් පසුබිමක සිට සරත් දසනායකට සේනගේ චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය පවරන්නට සේනගේ කැමැත්ත නැත. හේතුව ඒකාලේ චිත්‍රපටවලට මිනිස්සු ආවේ නැගලා යන සිංදු අහන්නට ය. සෝමෙගේත් මිල්ටන්ගේත් ඉල්ලීමට සේනගෙන් පිළිතුරු ලැබෙන්නේ ආර්ථික විද්‍යාවේ න්‍යායන් ගෙනි.

"දැන් බලන්නකො මිල්ටන් ඔයා අලූත් ඩිරෙක්ටර් කෙනෙක්. සෝමෙ අලූත් රයිටර් කෙනෙක්. ගාමිණීල, මාලනීල, ජෝ දාලා අලූත් කැමරාමන් කෙනෙක්, සංස්කරණයත් අලූත්. එහෙම එකේ අලූත් ෆිල්ම් එකක්. අනික මේ කාලේ හොඳට දුවන ෆිල්ම් එකක් වෙන්ඩ නම් මට ඕනෑ මේකට ජෝතිපාල -ඇන්ජලින් - එම්.එස්. දාල මියුසික්වලට පී.එල්.ඒ. සෝමපාලව දාගන්න. මේ විදයම් කරන්නෙ සල්ලිනේ. අපි මේ වියදම් කරන සල්ලි ටික ආපහු ආවොත්නෙ මට තව එකක් කරන්න පුළුවන් වෙන්නෙ."

ඒ සේනගේ ආර්ථික විද්‍යා පාඩම ය.

"දසේ කියන්නෙ ක්ලැසික් පොරක්......" සෝමපාල ලීලානන්ද ද පරාජය බාර නොගෙනම කීවේය.

"හරි..... දසේ ජෝතිපාලට කරපු සිංදු නැද්ද" සේන සත්තමක් දැම්මේ ය.

"බඩු තියෙනවා" සෝමේ ද වැඩේ අතහරින්නේම නැත. මිල්ටන් නිහඬවම සෝමේ දෙස රවා බැලූවේය.

"අහල බලමු එහෙනං"

හරි.. ලබන සුමානෙ අපි දසේ කරපු හොඳ සිංදු